රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021(II)

මගේ අංකය : EST-6/03/LEA/3381
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2021.05.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්, දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම

2021.03.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 තාවකාලිකව අත්හිටුවමින් නිකුත් කළ 2021.04.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(I) හි විධිවිධාන වෙනුවට 2021.05.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ආයතන වෙත නිලධරයන් කැඳවීමේ දී පහත විධිවිධාන පරිදි කටයුතු කළ යුතු ය.

02. රජයේ කාර්යයන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය අවම කාර්යය මණ්ඩලය සේවයට කැඳවාගැනීමට තීරණය කිරීමේ බලය අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් වෙත පැවරේ.

03. එසේ අවම සේවක සංඛ්‍යාවක් සේවයට කැඳවන අවස්ථාවේ දී වුව ද සේවා මුර ක්‍රමයක් හෝ වෙනත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු ය.

04. එලෙස සේවා මුරයක් හෝ විධිමත් ක්‍රමවේදයක් සැකසීමෙන් පසු යම් නිලධරයෙකු ඒ අනුව සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය නිලධරයාගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතු ය.

05. ඉහත උපදෙස් පරිදි රජයේ ආයතන වෙත නිලධරයන් කැඳවීමේ දී ගර්භනී නිලධාරිනියන් සේවයට නොකැඳවීමට පියවර ගත යුතු ය.

06. සේවා මුර ක්‍රමයට හෝ සේවයට කැඳවීමට අනුගමනය කරන විධිමත් ක්‍රමවේදයට අනුව සේවයට නොකැඳවූ දිනයක දී වුව ද සෑම රජයේ නිලධරයෙකුම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරියට අදාළ කාර්යයන්හි යෙදීමට සූදානම්ව සිටිය යුතු ය.

07. කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අංශ මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ හා සමගාමීව සේවා ස්ථානවලට නිලධරයන් සහ මහජනතාව කැඳවීමේ දී පහත මාර්ගෝපදේශ ද අනුගමනය කළ යුතු ය.

(අ) හැකි සෑම අවස්ථාවකදීම පොදු ප්‍රවාහන සේවාවන් වෙනුවට සංචිත වාහන, වෙන් කරන ලද වාහන සහ නිලධරයන්ගේ පෞද්ගලික වාහන යොදවා ගැනීම දිරිමත් කිරීම.

(ආ) අත්‍යවශ්‍ය කරුණුවලට හැර මහජනතාව සේවා ස්ථාන වෙත පැමිණීම සීමා කිරීම.

(ඇ) හැකි සෑම අවස්ථාවකදීම මාර්ගගත (Online) ක්‍රමවේදයට අනුව සේවාලාභීන්ගේ අවශ්‍යතා සපුරාදීමට ක්‍රියා කිරීම.

08. යම් රජයේ නිලධරයකු පවතින තත්ත්වය තුළ නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමුකර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමුකර ඇත්තේ රජයේ නිරෝධායන නීතිරීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම් එවැනි නිලධරයන් සඳහා එම නිරෝධායන කාල සීමාව ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 12:9 උප වගන්තියෙහි විධිවිධාන පරිදි සම්පූර්ණ වැටුප් සහිත කාල සීමාවක් ලෙස සැලකිය යුතු ය.

09. කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය විසින් දැනටමත් නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් සහ ඉදිරියේ දී නිකුත් කරනු ලබන සෞඛ්‍ය උපදෙස් අනුව තම ආයතනයන්හි නිලධරයන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කළ යුතු ය.

10. මෙමඟින් අත්‍යවශ්‍ය රජයේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම, රාජ්‍ය ආයතන කොවිඩ් 19 නිදහස් කලාප වශයෙන් පවත්වාගෙන යාම, රාජ්‍ය නිලධරයන් කොවිඩ් 19 අවදානමට ගොදුරුවීම වළක්වා ගැනීම, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආසාදිතයන් වීම වළක්වා ගැනීම සහ කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය අවම කරගැනීම යන කරුණු විශේෂිතව අපේක්ෂා කරන බව ද අවධාරණය කෙරේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය